23

# මහියංගණයේ දේවාල පෙරහැර හා වැදි පෙරහැර තුළින් ප්‍රකට වන ආගමික සහජීවනය පිළිබඳ දැක්මක්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මිරිස්වත්තේ විමලඥාණ හිමි,

මහියංගණ පෙරහැර හෝ මහියංගණ දේවාල පෙරහැර යනුවෙන් ද හැඳින්වෙන මහියංගණ සමන් දේවාල පෙරහැර බිම්තැන්නේ බෞද්ධ ජනයාගේ සිත් බෞද්ධාගමික හැඟීම්වලින් ප්‍රබෝධමත් කරන බෞද්ධ සංස්කෘතික උළෙළකි. මහියංගණ රජමහ විහාරය හා සමන් දේවාලය එක්ව මෙම පෙරහැර සංවිධානය කරන අතර එහිලා මූලිකත්වය ගන්නේ මහියංගණ සමන් දේවාලයයි. ලංකාවේ පැවැත්වෙන බෞද්ධ පෙරහැර අතර ඉතා වැදගත් පෙරහැරකි සමන් දේවාල පෙරහැර. මෙම පෙරහැර තරම් මනබඳනා වෙනත් කලා මංගල්‍යයක් බිම්තැන්න ප්‍රදේශයේ නැති බවද කිව යුතු ය.

මෙම ලිපියෙහි විශේෂයෙන් අප අවධානයට ලක් කරන්නේ මහියංගණ සමන් දේවාල පෙරහැරෙහි එක් සුවිශේෂී අංගයක් කෙරෙහි ය. මෙම පෙරහැර ලංකාවේ ආදීවාසීන්ගේ හෙවත් වැදි ජනයාගේ සංස්කෘතික දායකත්වය ලබා දෙන එකම පෙරහැර ලෙස හැඳින්විය හැකි වෙයි. වෙනත් ආකාරයකින් පවසතොත් සිංහල බෞද්ධ ජනයා හා වැදි ජනයා සම්බන්ධ වන එකම සංස්කෘතිකාංගය මහියංගණ පෙරහැරයි. ප්‍රකට දඹාන ආදිවාසී ගම්මානයේ පදිංචිව සිටින ඌරුවරිගේ වැදි ජනයා

පවත්නා සම්බන්ධය නිසා මෙම දෙවියන් පිළිබඳ මුළු මහත් ලාංකීය බෞද්ධයන් තුළ ඇත්තේ ඉමහත් ගෞරවපූර්වක හැඟීමකි.

බුදුන් වහන්සේගේ සිරිපා පිහිටුවීම පිළිබඳ සිද්ධියෙන් පසු ක්‍රි.ව. 10 වැනි සියවස වන තෙක් සමන්තකූටය පිළිබඳ වංශකථා නිහඬය. අනුරාධපුර යුගයේ අග භාගයේ දී සිවුවැනි කසුප් රජුගේ පුත්‍ර සක්ක සෙනෙවිගේ බිරිඳ වූ වජිරා කුමරිය ශ්‍රී පාද ලාංඡනය පිහිටි ස්ථානයේ මෙහෙණි අසපුවක් කළ බව මහාවංශයෙහි සඳහනි (කිරිඇල්ලේ ඥාණවිමල හිමි, 2001 : 17). සමන් දෙවියන් වෙනුවෙන් කැප කර තැනූ දේවාලයක් පිළිබඳ ඓතිහාසික තොරතුරු ලැබෙන්නේ පොළොන්නරු යුගයේ දී ය. රාජාවලියේ සඳහන් පරිදි මහාපරාක්‍රමබාහු රජ ශ්‍රීපාදය වන්දනා කර සමන් දෙවිඳු වෙනුවෙන් දේවාලයක් තනවා ඇත (රාජාවලිය : 211).[5] කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නමින් හඳුන්වනු ලැබූ දෙවන පරාක්‍රමබාහු රජු විසින් ද සමන් දෙවියන් වෙනුවෙන් සිරිපා මළුවෙහි දෙවොලක් තනවා සමන් දෙවිරුවක් එහි වැඩම කළ බව පූජාවලියේ සඳහනි (පූජාවලිය : 810). ඇතැම් විට මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේ තැනූ දේවාලය ඒ වන විට විනාශ වී හෝ ජරාවාස වී තිබෙන්නට ඇත. වර්තමාන මහා සමන් දේවාලයේ ආරම්භය ද මේ රජුගේ සමයේදීම සිදු වූ බවට සාධක සමන් සිරිත නම් කුඩා පද්‍ය ග්‍රන්ථයකින් ලැබේ. දඹදෙණි යුගයේ දෙවන පැරකුම්බා රාජ්‍ය සමයේ සපරගමු විහාරයේ වැඩසිටි ශීලවංශ නම් හිමි නමකට සමනල ගිර ගුහාවක තිබී සම්භ වූ සමන් දේව ප්‍රතිමාවක් සපරගමු විහාරයට ගෙන ගොස් විහාරයේ ප්‍රතිමා ගෘහයේ තැන්පත් කර තේවා කටයුතු සිදු කරන ලදී. මේ අතර සබරගමුවේ මැණික් ගැරීමේ යෙදුනු දෙවන පරාක්‍රමබාහු රජුගේ ආර්යකාමදේව නම් ඇමතියෙක්